සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය, 2025
General Information Technology Examination, 2025

GIT | S | I, II

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I, II
General Information Technology I, II

පැය තුනයි
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
Additional Reading Time -10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න

## සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I

1. ආදාන උපක්‍රමයක් සඳහා උදාහරණයක් වන්නේ කවරක්ද?
   1) මුද්‍රකය   2) තිරය   3) යතුරු පුවරුව   4) ස්පීකරය

2. පරිගණකයක ආදාන හා ප්‍රතිදාන යන දෙයාකාරයටම ක්‍රියාකරන්නේ පහත දක්වා ඇති කවර උපක්‍රමයද?
   1) ස්පර්ශක තිරය
   2) ස්පර්ශක පෑඩය (touch pad)
   3) තීරුකේත කියවනය
   4) සුපරික්සකය (scanner)

3. සකසනයක වේගය සාමාන්‍යයෙන් දක්වනු ලබන්නේ,
   1) RPM වලිනි   2) Mbps වලිනි   3) තත්පරවලිනි   4) Hz වලිනි

4. පහත සඳහන් කුමන උපක්‍රමයක දත්ත කියවීම සඳහා ලේසර් (ප්‍රකාශ) තාක්ෂණය භාවිතා කරනු ලබන්නේ ද?
   1) මුද්‍රකය
   2) CD ධාවකය
   3) සුපරික්සකය
   4) සැනෙලි ධාවකය (flash drive)

5. UPS එකක් භාවිතා කරනු ලබන්නේ,
   1) CPU එක සිසිලනය කිරීමටය.
   2) උපස්ථ (backup) දත්ත ආචයනයක් (storage) ලබාදීමට ය.
   3) උපස්ථ බල සැපයුමක් ලබාදීමට ය.
   4) අන්තර්ජාලයේ වේගය වැඩි කිරීමට ය.

6. පරිගණක පද්ධතියක භෞතික කොටස් හඳුන්වනු ලබන්නේ,
   1) මෘදුකාංග ලෙස ය
   2) දත්ත ලෙස ය
   3) දෘඩාංග ලෙස ය
   4) ක්‍රමලේඛ ලෙස ය

7. පහත සඳහන් ඒවායින් කවරක් තොරතුරු සමග සසඳන කල්හි දත්ත සඳහා උදාහරණයක් වන්නේ ද?
   1) 98, 75, 87
   2) පන්ති සාමාන්‍ය 86 ක් වේ.
   3) 20% ක විකුණුම් වට්ටම
   4) පසුගිය මාසයේ වර්ෂාපතනය

8. පහත සඳහන් කවර ක්‍රියාවලි මගින් දත්ත, තොරතුරු බවට පරිවර්තන කෙරෙන්නේ ද?
   1) ආදානය   2) සැකසීම   3) ප්‍රතිදානය   4) ආචයනය

9. පහත සඳහන් කවරක් මෙහෙයුම් පද්ධතියක ප්‍රධාන කාර්යයක් නොවන්නේ ද?
   1) ක්‍රමලේඛ සම්පාදනය කිරීම
   2) මෘදුකාංග කළමනාකරණය
   3) ගොනු කළමනාකරණය
   4) පරිශීලක අතුරුමුහුණත් සැපයීම

10. CPU හි ඇති පාලන ඒකකය වගකියනු ලබන්නේ,
    1) උපදෙස් අනුගමනය සහ සම්බන්ධීකරණය කාර්යසාධනය කිරීමට ය.
    2) අංකගණිතමය ක්‍රියාකාරකම් කාර්යසාධනයට ය.
    3) තාර්කික ක්‍රියාකාරකම් කාර්යසාධනයට ය.
    4) ස්පන්ද වේගය (clock speed) කළමනාකරණය කිරීමට ය.

11. සකසනයක කාර්යසාධනය (performance) ප්‍රධාන ලෙසම රඳා පවතිනුයේ,
    1) තිරයේ විභේදනය (resolution) මත ය.
    2) ස්පන්ද වේගය (clock speed) මත ය.
    3) ROM හි ප්‍රරූපය (type) සහ ප්‍රමාණය මත ය.
    4) යතුරු පුවරුවේ ප්‍රරූපය මත ය.

12. බලපත්‍රලාභී (proprietary) මෙහෙයුම් පද්ධතියක් සඳහා උදාහරණයක් වන්නේ පහත සඳහන් කවරක් ද?
    1) Linux 2) Ubuntu 3) Windows 4) Android

13. මෙහෙයුම් පද්ධති සන්දර්භයේදී, GUI යන්නෙන් කියැවෙන්නේ කුමක් ද?
    1) Graphical User Instructions
    2) General User Inputs
    3) General User Interface
    4) Graphical User Interface

14. ප්‍රාථමික ආචයනයක් වන්නේ පහත සඳහන් කුමක් ද?
    1) දෘඪ ඩිස්කය 2) RAM 3) DVD 4) චුම්බක පටි

15. ද්විමය 1010 හි ෂඩ්දශමය නිරූපණය වන්නේ පහත කවරක් ද?
    1) A 2) B 3) 10 4) 12

16. පහත සඳහන් කවරක් ද්විමය සංඛ්‍යාවක් වන්නේ ද?
    1) 1000 2) H002 3) B000 4) 8101

17. බිටු 7 මගින් නිරූපණය කළ හැකි උපරිම ලකුණු රහිත (unsigned) නිඛිලය (integer),
    1) 7 වේ. 2) 127 වේ. 3) 128 වේ. 4) 255 වේ.

18. අංක පද්ධතියක පාදය නිරූපණය කරන්නේ,
    1) පද්ධතියේ කුඩාම අංකයයි.
    2) පද්ධතියේ විශාලතම අංකයයි.
    3) පද්ධතියේ වඩාත්ම වෙසෙසි අගය (most significant value) යි.
    4) පද්ධතියේ ඇති වෙනස් සංකේතය (symbols) සංඛ්‍යාවයි.

19. 25 යන දශමය සංඛ්‍යාවට තුල්‍ය වන ද්විමය සංඛ්‍යාව කුමක්ද?
    1) 11001 2) 11000 3) 10101 4) 10011

20. මොඩමයක (modem) ප්‍රාථමික කාර්යය කුමක්ද?
    1) අංකිත සංඥා ප්‍රතිසම සංඥා බවට පරිවර්තනය සහ එහි ප්‍රතිවිරුද්ධ කාර්යය කිරීම
    2) පරිගණක සැකසුම් වේගය වැඩි කිරීම
    3) පරිගණක මතකය කළමනාකරණය
    4) ග්‍රැෆික්ස් සංදර්ශනය කිරීම

21. අංකිත අනුරුව (digital image) ක කුඩාම ඒකකය වන්නේ පහත සඳහන් කවරක්ද?
    1) බයිටය
    2) පික්සලය (pixel)
    3) බිටුව
    4) අඟල්

22. අනුරුවක අඩංගු වන පික්සල සංඛ්‍යාව හඳුන්වනු ලබන්නේ,
    1) දීප්තිය ලෙස ය.
    2) විභේදනය (resolution) ලෙස ය.
    3) ප්‍රභේදනය (contrast) ලෙස ය.
    4) වර්ණය ලෙස ය.

23. නාභිය (hub) හා ස්විචයක කාර්යය නිවැරදිව සඳහන් වරණය කුමක් ද?
    1) නාභියක් මගින් දත්ත ඉදිරියට යවනු ලබන්නේ එහි අවශ්‍ය වූ විශේෂිත උපක්‍රමයක් වෙත වන අතර, ස්විචයක් මගින් සියලුම උපක්‍රම වෙත දත්ත යවනු ලබයි.
    2) නාභියක් සහ ස්විචයක් යන දෙකම, අදාළ ලාභියා වෙත පමණක් දත්ත ඉදිරියට යවනු ලැබුව ද ස්විචය වඩා වේගවත් වේ.
    3) ජාලයෙහි පවතින සියලු උපක්‍රම වෙත නාභිය දත්ත යවනු ලබන අතර ස්විචය ඒවා ඉදිරියට යවනු ලබන්නේ අදාළ උපක්‍රමය වෙත පමණි.
    4) ජාලයක ඇති සියලුම උපක්‍රමවලට, නාභි හා ස්විච යන දෙකම මගින් නිරතුරු දත්ත විකාශනය කරනු ලබයි.

24. Google drive වැනි වලාකුළු ආචයන සේවාවන් මගින් විය හැකි අවාසියක් වන්නේ පහත සඳහන් කවරක් ද?
   1) ඔබට විවිධ උපක්‍රමවලින් ඔබේ ගොනුවලට ප්‍රවේශ වීම කළ නොහැකි වීම ය.
   2) දත්ත ළඟා කරගැනීමේ වේගය, ඔබගේ අන්තර්ජාල සම්බන්ධතාව මත රඳා පැවතිය හැකි ය.
   3) සේවා සැපයුම්කරු මගින් ඔබගේ ගොනු උපස්ථ කරනු නොලැබේ.
   4) අන් අය හා සහයෝගීතාව (collaboration) පැවැත්වීම අසීරු වනු ඇත.

25. පහත සඳහන් කවරක් පැතුරුම්පතක වලංගු කෝෂ ලිපිනයක් වන්නේ ද?
   1) 1A   2) AB   3) A20   4) A10B

26. කෝෂ පරාසයක කුඩාතම අගය සෙවීම සඳහා පැතුරුම්පත්වල ඇති පහත සඳහන් කවර ශ්‍රිතයක් භාවිත කළ හැකි ද?
   1) MAX ( )   2) SUM ( )   3) MIN ( )   4) AVERAGE ( )

27. = 8 / 2 + 4 / 2 * 3 සූත්‍රය පැතුරුම්පත් කෝෂයකට ඇතුලු කළ විට පෙන්වනු ලබන අගය කුමක් ද?
   1) 2   2) 10   3) 12   4) 18

28. පැතුරුම්පතක පුද්ගලයකු විවාහක ද? නැත්නම් අවිවාහක ද? යන්න ආචයනය කිරීම සඳහා වඩාත්ම යෝග්‍ය දත්ත ප්‍රරූපය (data type) කුමක් ද?
   1) Number   2) Date/Time   3) Currency   4) Yes/No

29. Unicode හඳුන්වාදෙනු ලැබුවේ,
   1) ද්විමය කේත ක්‍රමය ප්‍රතිස්ථාපනය කිරීමට.
   2) අන්තර්ජාතික භාෂාවලට සහයෝගීතාව දැක්වීමට ය.
   3) අන්තර්ජාල ප්‍රවේශ වේගය වැඩි කිරීමට ය.
   4) ASCII කේතය ප්‍රතිස්ථාපනය කිරීමට ය.

30. පහත සඳහන් කවර HTML උසුලනය වලංගු නොවන්නේ ද?
   1) <h2>   2) <ol>   3) <link>   4) <href>

31. උකුළු පරිගණකයක් (laptop computer) මිලදී ගැනීමේදී සලකා බැලීම සඳහා අත්‍යවශ්‍ය නොවන ගුණාංගයක් වන්නේ පහත සඳහන් කවරක් ද?
   1) RAM හි ධාරිතාව   3) සකසනයේ වේගය
   2) මූසිකය හා යතුරු පුවරුව   4) මිල

32. පහත සඳහන් URL අතුරින් වැරදි ආකාරයේ පවතින්නේ කුමක් ද?
   1) http//www.edupub.gov.lk   3) https://moe.gov.lk
   2) https://www.e-thaksalawa.moe.gov.lk   4) https://www.doenets.lk

33. වෙබ් පිටු නිර්මාණය සඳහා බහුලව භාවිතා වන්නේ පහත සඳහන් කවර භාෂාව ද?
   1) Python   3) HTML
   2) Pascal   4) Java

34. වීඩියෝ සංස්කරණයේදී සංක්‍රාන්ති (transitions) ප්‍රධාන වශයෙන් භාවිත වන්නේ,
   1) ශ්‍රව්‍ය (audio) මුසු කිරීමට ය.   3) උපසිරැසි එක් කිරීමට ය.
   2) පසුරු අතර සුමට මාරුවීමකට ය.   4) වීඩියෝ අපනයනයට ය.

35. පහත සඳහන් කවර හැඩසව්වක් (format) වීඩියෝ අපනයනය සඳහා බොහෝ විට භාවිතා වන්නේ ද?
   1) .txt   2) .mp4   3) .docx   4) .pptx

36. වීඩියෝ සංස්කරණයේදී කප්පාදු කිරීමේ (trimming) ක්‍රියාවලිය මගින් කියැවෙන්නේ,
   1) වීඩියෝ පසුරුවල අතර කොටස් කපාදැමීම ය.
   2) වර්ණ පෙරහන් (filters) එකතු කිරීම ය.
   3) ශ්‍රව්‍ය පසුරු දෙකක් යා කිරීම ය.
   4) නැවත ධාවන (playback) වේගය වැඩි කිරීම ය.

37. සමර්පන මෘදුකාංගයක ඇති කිනම් ගුණාංගයක් මගින් පාඨ (text) සහ අනුරූප (images) වැනි වස්තූන්ට චලන ආවරණ ආදේශ කිරීමට ඉඩ සලසා දෙනු ලබන්නේ ද?
   1) Transitions   2) Animations   3) Design themes   4) Slide master

ictpastpaper.com

38. විද්‍යුත් තැපැල්හි කුමන ක්ෂේත්‍රයක් (field) මගින් ලබන්නාගේ ලිපිනය සඟවනු ලබන්නේ ද?
   1) To  2) Cc  3) Bcc  4) Subject

39. පහත සඳහන් දෑ අතරින් වලංගු නොවන විද්‍යුත් ලිපිනය කුමක් ද?
   1) john.doe@gmail.com
   2) info@company.org
   3) student@edu.lk
   4) user@@mail.com

40. https://www.example.com/index.html යන URL හි http://www.example.com යන කොටස මගින් නිරූපණය වන්නේ කුමක් ද?
   1) මාර්ගය (path)
   2) වසම් නාමය
   3) නියමාවලිය
   4) සම්පත

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය, 2025
General Information Technology Examination, 2025

GIT | S | I, II

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I, II
General Information Technology I, II

# සාමාන්‍ය තොරතුරු තාක්ෂණය II

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න

1.
(a) පරිගණකය ක්‍රියාත්මක මට්ටමේ පවතින්නේ යැයි ද, පරිගණක තිරය මත Windows මෙහෙයුම් පද්ධතියේ desktop දිස්වන්නේ යැයි ද, USB කෙවෙනියට සැනෙලි මතක ධාවකයක් (flash memory drive) සම්බන්ධ කර ඇතැයි සහ මෙම සැනෙලි ධාවකය හා දෘඪ ධාවකය පිළිවෙලින් E: හා C: ධාවක ලෙස පරිගණකය හඳුනාගෙන ඇතැයි උපකල්පනය කරන්න.
පහත සඳහන් කාර්ය කිරීම් සඳහා අත්‍යාවශ්‍ය පරිගණක ක්‍රියාකාරකම් ලියා දක්වන්න

I. C: ධාවකයේ මූලය (root) තුල දැනටමත් පවතින GIT නම් වූ ෆෝල්ඩරය විවෘත කිරීම.

II. C: ධාවකයෙහි වූ GIT ෆෝල්ඩරයේ ඇති notes.doc නම් වූ ගොනුව එම ෆෝල්ඩරය තුළ එලෙසම පවත්වා ගනිමින්, සැනෙලි මතක ධාවකයේ මූලය වෙත මාරු කිරීම (transfer).

III. C: ධාවකයෙහි වූ GIT ෆෝල්ඩරයේ ඇති tutorial.doc නම් වූ ගොනුව එම ෆෝල්ඩරය තුළ නොපවත්වා ගනිමින් සැනෙලි මතක ධාවකයේ මූලය වෙත මාරු කිරීම.

(b) සැනෙලි මතක ධාවකයට මාරු කරන ලද tutorial.doc ගොනුව හදිසියේ ඔබ අතින් මැකීගියේ නම් එය යළි ලබාගත (recover) හැකිද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

2. කලාප මට්ටමේ විභාගයකදී 11 වන ශ්‍රේණියේ සිසුන් ලබාගත් ලකුණු විශ්ලේෂණය කිරීම සඳහා පැතුරුම්පතක් නිර්මාණය කර දෙන මෙන් ඔබ පාසලේ විදුහල්පතිතුමා ඉල්ලා සිටියේ යැයි උපකල්පනය කරන්න. මේ සඳහා පහත දක්වා ඇති නියැදි ලකුණු ලැයිස්තුව විදුහල්පතිතුමාගේ අවශ්‍යතාව පෙන්වීම සඳහා ඔබ වෙත ලබා දී ඇත.

| Index No | Name with Initial | Mathematics | ICT | English |
|---|---|---|---|---|
| 10225 | K.A.Kumara | 78 | 81 | 68 |
| 10229 | T.Ravi | 81 | 74 | 70 |
| 10220 | A.M.Ahamed | 65 | 79 | 74 |
| 10218 | N.P.C.Mary | 88 | 69 | 80 |
| 10235 | M.N.Mallika | 69 | 87 | 79 |

a) ඉහත නියැදි ලකුණු ලැයිස්තුවේ දී ඇති පරිදි, පැතුරුම්පතෙහි තීරු පැවැතිය යුතු වේ.

b) එක් එක් ශිෂ්‍යයා විසින් ගණිතය (Mathematics), තොරතුරු තාක්ෂණය (ICT) සහ ඉංග්‍රීසි (English) යන ප්‍රශ්න පත්‍ර සඳහා ලබාගත් ලකුණුවල මුළු එකතුව (Total marks) සහ සාමාන්‍ය ලකුණ (Average mark), ‘English’ යන තීරුවට පසුව ඇති තීරු දෙකෙහි පෙන්විය යුතුය. පිළිවෙලින් මෙම තීරු දෙක ‘Total’ හා ‘Average’ ලෙස නම් කළ යුතුවේ.

c) සෑම විභාග ප්‍රශ්න පත්‍රයකම ලබාගත් ඉහළම සහ අඩුතම ලකුණු සිසුන්ගේ තොරතුරු අවසානයේදී ඇති ආසන්නම පේළි දෙකෙහි දැක්විය යුතුවේ. මේවායේ විස්තර 'Highest Marks' සහ 'Lowest Marks' ලෙස පිළිවෙළින් දැක්විය යුතු ය.

d) පැතුරුම්පතෙහි ඇති දත්ත, ශිෂ්‍යයාගේ සාමාන්‍ය ලකුණ මත පදනම්ව අවරෝහණ පටිපාටියට දැක්විය යුතු ය.

e) Average තීරුවට ආසන්නතම ඊළඟ තීරුව "No. of Papers above 74" ලෙස නම් කර, එම තීරුවේ එක් එක් ශිෂ්‍යයා විසින් ලකුණු 74 ට වැඩියෙන් ලබාගත් විභාග ප්‍රශ්න පත්‍ර ගණන දැක්විය යුතුය.
ඉහත අවශ්‍යතා මත පදනම්ව පහත දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. නියැදි දත්ත සඳහා දී ඇති තීරු නාම සහිතව, පැතුරුම්පතක දළ සටහනක් අඳින්න. ඔබේ දළ සටහනේ තීරු ලේබල හා පේළි ලේබල දැක්විය යුතුය.

ii. පැතුරුම්පතෙහි, ඉහත (b), (c) සහ (e) කොටස් ගණනය කිරීම සඳහා සූත්‍ර ලියන්න.

iii. ඉහත (d) කොටස ක්‍රියාත්මක කිරීමට අනුගමනය කළයුතු පියවර ලියා දක්වන්න.

3. ඩිජිටල් පරිපථ වල මූලික තැනුම් ඒකක තර්කන ද්වාර වේ.මේවා පරිගණක තුළ භාවිත වන්නේ තර්කන ක්‍රියාකාරකම් සිදු කිරීමට සහ තාර්කික තීරණ ගැනීමටය.

a) පරිගණක තුළ භාවිතා වන මූලික තර්කන ද්වාර තුන මොනවා ද?

b) පහත පරිපථ සටහන සලකා බලන්න.




i. A හා B යනු ස්විච දෙකක් වන අතර Q යනු බල්බයකි. මේවායේ ON සහ OFF යන අවස්ථා පිළිවෙළින් 1 සහ 0 මගින් නිරූපණය කරයි. A, B හා Q අතර පැවතිය හැකි සියලු සම්බන්ධතා සහ සත්‍යතා වගුවක් මගින් දක්වන්න.

ii. ඉහත සත්‍යතා වගුවේ බූලියානු ප්‍රකාශය ලියන්න.

iii. ඉහත පරිපථයේ කාර්යය නිරූපණය කරනු ලබන්නේ කිනම් තර්කන ද්වාරයක් ද?

c) පහත සඳහන් සත්‍යතා වගුව සලකා බලන්න.

| A | B | Q |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 0 |
| 1 | 0 | 0 |
| 1 | 1 | 1 |

i. ඉහත සත්‍යතා වගුවේ බූලියානු ප්‍රකාශය ලියන්න.

ii. A හා B ස්විච දෙකක් හා Q යනු බල්බයක් නම්, ON සහ OFF අවස්ථා පිළිවෙළින් 1 හා 0 මගින් නිරූපණය වන විට, ඉහත සත්‍යතා වගුව නිරූපණය කිරීමට පරිපථ සටහනක් අඳින්න.

4. පුස්තකාලයේ ඇති පොත් කළමනාකරණය කිරීම සඳහා දත්ත සමුදායක් නිර්මාණය කිරීමට ඔබ පාසලේ විදුහල්පතිතුමා විසින් ඔබට පවරනු ලැබේ.විදුහල්පතිතුමා විසින් ඔබ හට පහත සඳහන් විස්තර ලබා දී ඇත. දත්ත සමුදාය විසින් පහත සඳහන් දත්ත කළමනාකරණය කළ යුතුය.

   a) පොත් බැහැරට ගෙන එන ලද සිසුන්ගේ දත්ත
   b) පුස්තකාලයේ දැනට පවතින පොත්වල දත්ත
   c) පොත් බැහැර ගෙන යාමේ වාර්තා

එක් අවස්ථාවකදී සිසුවකුට එක් පොතක් පමණක් බැහැර ගෙන යාමට පුස්තකාලය ඉඩ සලසා ඇත. ඔහු/ඇය විසින් ගෙන යන ලද පොත යළි භාර දීමෙන් පසු පමණක් තවත් පොතක් ලබා ගැනීමට අවකාශ ලබාදී ඇත.
විදුහල්පතිතුමාට ලබා දීමට පහත සඳහන් දෑ මූලික කරගත් දළ ලේඛනයක් පිළියෙල කරන්න.

A. පැතුරුම්පතක් තුළ මෙම දත්ත කළමනාකරණය කිරීමට වඩා දත්ත සමුදායක් නඩත්තු කරමින් එතුළ දත්ත ආචයනය කර තබා ගැනීමේ වාසි දෙකක් ලියන්න.
B. මෙම දත්ත සමුදාය සඳහා අවශ්‍ය වගු යෝජනා කරන්න.
C. ශිෂ්‍ය තොරතුරු පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ක්ෂේත්‍ර නාම සහ ඒවායේ දත්ත ප්‍රරූප යෝජනා කරන්න.
D. යෝජනා කරන ලද වගුවල ප්‍රාථමික යතුරු හඳුන්වන්න.
E. අවශ්‍ය වන ආගන්තුක යතුර මොනවාද? ඒවා අවශ්‍ය වන්නේ කුමන වගුවලට ද සහ එම ආගන්තුක යතුරු අවශ්‍ය ඇයිදැයි පැහැදිලි කරන්න.

5. සේවකයන් අතර සන්නිවේදනය සඳහා විද්‍යුත් තැපැල් සේවාවක් පවතින ගෝලීය තොරතුරු තාක්ෂණ සමාගමක සීමාවාසිකයෙකු ලෙස නදීකා සේවය කරයි. මෙම සමාගමේ සාමාජිකයන් රටවල් කිහිපයක වාසය කරයි. නදීකා විසින් රහස්‍ය ලේඛන බෙදා ගැනීම (share), අවසන්දින (deadlines) පිළිබඳව සියලුදෙනා යාවත්කාලීන කිරීම සහ ප්‍රතිපෝෂණ ඉල්ලා සිටීම වැනි දෑ කළ යුතු වේ.

   i. විද්‍යුත් තැපැල් සේවාව භාවිතයෙන් සිදුවිය හැකි අවදානම් මොනවාද?

   ii. කිහිපදෙනෙකුට විද්‍යුත් තැපැල් යැවීමේ දී අදාළ වූ ලබන්නාට හැර අනෙකුත් ලබන්නන්ගේ විද්‍යුත් තැපැල් ලිපින නිරාවරණය නොවන සේ ලිපි යැවිය යුතු බව සමාගම් කළමනාකාරීත්වය මගින් නදීකාට දැනුම් දී ඇත. විද්‍යුත් තැපැල් යැවීමේදී මෙම අවශ්‍යතාව ඉටු කර ගනු ලබන ආකාරය පැහැදිලි කරන්න.

   iii. විද්‍යුත් තැපැල් සංවාද ලිපියේ විෂය (subject) මත පදනම්ව කාණ්ඩ (group) ගත කිරීම (threads) බොහෝ විද්‍යුත් තැපැල් සේවා මගින් ලබාදී ඇති ගුණාංගයකි. වෘත්තීය සන්නිවේදන කළමණාකරණය කිරීමේදී මෙම ගුණාංගයේ තිබෙන වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.

ICTPastPaper.com

6. වෙබ් පිටුවක අතරික්සු දසුනක් (browser display) පහත රූපයේ දැක්වේ.



# ICT Society

Committee

- President : Mr. Nimal
- Secretary : Miss. Nirmala
- Treasurer : Mr. Saman

Committee Members

| Name | Class |
|---|---|
| Mr. Sunil | 12 D |
| Miss Rupika | 11 A |

වෙබ් අතරික්සුවක් තුළින් ඉහත ප්‍රතිදානය (output) ලබා ගැනීමට අවශ්‍ය HTML කේතය ලියා දක්වන්න.

7. සමර්පන මෘදුකාංග පාදක කර ගනිමින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

a) සමර්පනයක් නිර්මාණය කිරීමේදී තේමාවක් (theme) භාවිත කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.

b) කථක සටහන් (speaker notes) ප්‍රයෝජනවත් වන්නේ ඇයි?

c) සමර්පනයක් නිර්මාණයේදී, කදා පිරිසැලසුම් (side layouts) ප්‍රයෝජනවත් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

d) සජීවකරණය (animation) හා සංක්‍රාන්තිය (transition) අතර ප්‍රධාන වෙනස පැහැදිලි කරන්න.

e) සමර්පන ගොනුවක් '.ppsx' යන ආකාරයෙන් සුරැකීමේ දී ඇති ප්‍රධාන වාසිය කුමක්ද?

f) සමර්පනයක ඇති කදා දෙකක් අතරට නව කදාවක් එකතු කරන ආකාරය සඳහන් කරන්න.